# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2358/79 - 2023 නොවැම්බර් මස 18 වැනි සෙනසුරාදා - 2023.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/AKU/4/2/1/60.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/12/2018/ WS/297.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 460 පරිච්ඡේදය 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 585 දරන බලකඩුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බලකඩුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද 2023.07.20 වැනි දිනැති අංක කා. සි. 320672 දරන මූලික පිඹුරේ, කැබලි අංක A වශයෙන් දැක්වෙන, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0372 ක පමණ වන සයිස්ටන් වතුයාය නැමති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

**01. කැබලි අංක A**

ඉඩමේ නම: සයිස්ටන් වත්ත; හිමිකම් කියන අය : 1. එච්. එම්. ජී. වෙලගෙදර, සයිස්ටන් බංගලාව, අලවතුගොඩ. 2. එච්. එම්. එන්. වෙලගෙදර, සයිස්ටන් බංගලාව, අලවතුගොඩ; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0372 (පර්චස් 14.7).

*මායිම්* :

*උතුරට* : එච්. එම්. ජී. වෙලගෙදර සහ එච්. එම්. එම්. එන් වෙලගෙදර හිමිකම් නියන සයිස්ටන් වත්ත; *නැගෙනහිරට* : එච්. එම්. ජී. වෙලගෙදර සහ එච්. එම්. එම්. එන් වෙලගෙදර හිමිකම් නියන සයිස්ටන් වත්ත; *දකුණට* : මාර්ගය (පමාසංදෙ) සීමාසහිත එච්. එම්. ජී. වෙලගෙදර සහ එච්. එම්. එම්. එන් වෙලගෙදර හිමිකම් නියන සයිස්ටන් වත්ත; *බටහිරට* : එච්. එම්. ජී. වෙලගෙදර සහ එච්. එම්. එම්. එන් වෙලගෙදර හිමිකම් කියන සයිස්ටන් වත්ත සහ පත්‍ර 1 හි 3 වැනි බිම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් හා අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 ජනවාරි මස 11 වැනි දින පෙ.ව. 10.00ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 දෙසැම්බර් මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීමට, වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0199

1A - G 040787 – 14 (2023/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*